සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

84 | S | I

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .........................................  ශිල්ප කලා - I  කාලය : පැය 01යි.

වැදගත් :

- ✳ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 40 සඳහා ලකුණු 40ක් හිමි වේ.
- ✳ ප්‍රශ්නයට අදාළව දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට පිළිතුරු සැපයීමට ලබා දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ කවය තුළ (X) සලකුණ යොදන්න.

(01) බීරළු රේන්ද සැකසීම සඳහා ගන්නා විශේෂිත උපකරණය කුමක් ද?
(1) සකපෝරුව  (2) දුවන නඩාව
(3) බීරළු කොට්ටය  (4) තැටින් කටුව

(02) පිත්තල කර්මාන්තය සඳහා ගන්නා ලෝහ වර්ග ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) තඹ හා තුත්තනාගම්  (2) ඇලුමිනියම් හා යකඩ
(3) තඹ හා රත්තරන්  (4) තුත්තනාගම් හා රත්තරන්

(03) මැටි කර්මාන්තය සඳහා මැටි නිධි ස්ථානගත වී ඇති පිළිතුර තෝරන්න.
(1) කැලණිය, මොළගොඩ  (2) කොළඹ, කළුතර
(3) මහනුවර, මාතලේ  (4) කැලණිය, මාතර

(04) පහත සඳහන් කලාවන් අතරින් ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවට අයත් කාණ්ඩය තෝරන්න.
(1) ශාන්ති කර්ම, ගොයම් කවි  (2) පැල් කවි, පේෂ කර්මාන්තය
(3) සොකරි නාට්‍ය, කළගෙඩි නැටුම්  (4) කරත්ත කවි, පැල් කවි

(05) ලාක්ෂා කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගන්නේ කෙසේ ද?
(1) කජු මැලියම් වලිනි.  (2) ලාක්ෂා කෘමියාගෙන් නිකුත් වන ලාටු
(3) පටපණුවාගෙන් පිටවන ලාටු වලිනි.  (4) ගොටු ගසේ කිරි වලිනි.

(06) ජ්‍යාමිතික උපකරණ කට්ටලයේ විහිත චතුරස්‍ර දෙකෙන් එක් විහිත චතුරස්‍රයක කෝණවල අගය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) $45^0, 45^0, 60^0$  (2) $60^0, 30^0, 60^0$
(3) $45^0, 45^0, 90^0$  (4) $60^0, 30^0, 45^0$

(07) ජ්‍යාමිතික ඇඳීම සඳහා ගන්නා ජාත්‍යන්තරව සම්මත වූ මිමි අනුව Ao කඩදාසියක දිග, පලල නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) 841mm x 1189mm  (2) 594mm x 841mm
(3) 420mm x 594mm  (4) 297mm x 420mm

(08) සැලසුමක් ඇඳීමේ දී කඩදාසිය ඇඳීමේ පුවරුවට නිවැරැදිව සවි කර ගන්නේ කෙසේ ද?
(1) අල්පෙනෙති ගැසීමෙන්  (2) ඇණ ගැසීමෙන්
(3) පුවරුකටු ගැසීමෙන්  (4) ටී රූල භාවිත කිරීමෙන්

(09) සිසුවෙකු විසින් අඳින ලද ඝනකාභයක විවිධ රේඛා දක්නට ලැබේ. එම රේඛා අතරින් කඩ රේඛා යොදා ගන්නේ කුමන කාර්යයන් සඳහා ද?
(1) සමමිතික බව දැක්වීම.  (2) පෙනෙන දාර දැක්වීම
(3) මිනුම් රේඛා දැක්වීම.  (4) සැඟිදාර දැක්වීම.

(10) සෙ. මී. 6ක් දිග රේඛාවක් සමාන කොටස්වලට බෙදාන ආකාරය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(a) 6cm දිග රේඛාවක් ඇඳීම.
(b) එම රේඛාවට ආධාරක පාදයක් ඇඳීම.
(c) ආධාරක රේඛාව සමාන කොටස්වලට බෙදීම.
(d) ආධාරක රේඛාවේ අවසන් ලක්ෂයේ සිට සරල රේඛාවට රේඛා ඇඳීම.

(1) a, b, c, d    (2) a, c, b, a
(3) a, a, c, d    (4) c, a, b, a

(11) පහත දක්වා ඇති කෝණවල අගය නිවැරදිව දක්වා පිළිතුර ලියන්න. සුළු කෝණය, මහා කෝණය, සෘජු කෝණය

(1) $60^0$, $120^0$, $90^0$    (2) $90^0$, $180^0$, $60^0$
(3) $90^0$, $60^0$, $180^0$    (4) $60^0$, $120^0$, $180^0$

(12) පහත දක්වා ඇති ආයත චතුරශ්‍රයේ දැකිය හැකි ලක්ෂණයක් සහිත පිළිතුර තෝරන්න.



(1) කෝණ සෘජුකෝණී වේ.
(2) සම්මුඛ පාද සමාන්තර වේ.
(3) සම්මුඛ පාද සමාන්තර නොවේ.
(4) පාද දිගින් සමාන වේ.

(13) සමචතුරස්‍රයක අභ්‍යන්තර කෝණයක අගය කීය ද?

(1) $90^0$    (2) $60^0$
(3) $120^0$    (4) $45^0$



(14) ඉහත රූප සටහනින් දැක්වෙන්නේ ඇසුරුම් පෙට්ටියකි.
මෙය දිග හැරිය විට දක්නට ලැබෙන පෙනුම සහිත රූපය තෝරන්න.



(1)    (2)    (3)    (4)

(15) රෙදිපිළි වර්ණ ගැන්වීමේ දී භාවිත කරන සායම් පිළිබඳ විශේෂ දැනුමක් තිබිය යුතු ය. එහි දී අත්‍යවශ්‍ය කරුණක් වන්නේ,

(1) සායම් පෙවීමයි.    (2) වර්ණ සංකලනයයි.
(3) සායම් ආලේපනයයි.    (4) මුද්‍රණය කිරීමයි.

(16) රෙදිපිළි අලංකරණයේ දී ''සායම් පෙවීම'' ක්‍රමය මගින් කෙරෙන කාර්ය කුමක් ද?

(1) බාහිර උපකරණයකින් සායම් ගැල්වීම.    (2) පින්සල් භාවිතයෙන් ආලේපනය කිරීම.
(3) පෙහෙකම් ද්‍රව්‍ය පුරාම වර්ණ පැතිරවීම.    (4) බාහිර උපකරණ ඇසුරින් මුද්‍රා තැබීම.

(17) අතීතයේ වර්ණ ලබා ගැනීමට භාවිත කළ පරිසර සම්පත් යොදා ගෙන ඇත. මෙහිදී ''කළු වර්ණය'' සාදා ගැනීමට යොදාගෙන ඇත්තේ මොනවා ද?

(1) ගොකටු ගසේ කිරි වලිනි.    (2) නිල් අවරිය කොළ වලිනි.
(3) මකුළු මැටි වලිනි.    (4) අඳුන් දැලි වලිනි.

(18) මූලික වර්ණ දෙකක් සම්මිශ්‍රණය වීමෙන් ද්විතියික වර්ණයක් ලැබේ. මෙහි දී නිල් සහ කහ වර්ණය මිශ්‍ර වීමෙන් සෑදෙන වර්ණය වන්නේ,

(1) කොළ වර්ණය    (2) දම් වර්ණය
(3) නිල් වර්ණය    (4) තැඹිලි වර්ණය

(19) මෝස්තරයක ලා පැහැති කොටස මූලික වර්ණයට වඩා අඩු පැහයක් යෙදීම හඳුන්වන්නේ,
(1) සේදුම නමිනි. (2) අධි ආලෝකකරණය නමිනි.
(3) යටි ආලේපන නමිනි. (4) අඳුකරණය නමිනි.

(20) නිෂ්පාදන රෙදිවල ස්වාභාවිකව හා බාහිර එක් වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ කිනම් නමකින් ද?
(1) පසු පිරියම් කිරීම නමිනි. (2) කැඳ ඉවත් කිරීම නමිනි.
(3) පෙර පිරියම් කිරීම නමිනි. (4) මළ හරණය කිරීම නමිනි.

(21) රෙදිපිළි අලංකරණයේ දී ස්වාභාවික පිහිටි රටාවක් මත හෝ කපා ගත් මෝස්තරයක් මත සායම් ආලේප කර මුද්‍රා තබා ගැනීම හඳුන්වන්නේ,
(1) සිදුරු තහඩු මුද්‍රණයයි. (2) අච්චු මුද්‍රණයයි.
(3) සේද රාමු මුද්‍රණයයි. (4) තිර රාමු මුද්‍රණයයි.

(22) මූලික ආලේපන ගැල්වීමට සහ තරමක් ලොකු මහත රේඛා ඇඳීමට සුදුසු පින්සල් වර්ගය ලෙස හඳුන්වන්නේ,
(1) පැතලි පින්සල් (2) විශාල සේදුම් පින්සල්
(3) රවුම් පින්සල් (4) ලොකු පින්සල්

(23) කිසියම් දිගකින් යුතු රේඛීය දාමයක ආකාරයට පිළියෙළ වීමකින් ගොඩනැගුණු ව්‍යුහය හඳුන්වන්නේ,
(1) නූල් ය. (2) පත්‍ර ය.
(3) කෙඳි ය. (4) පට්ටා ය.

(24) කපු වවන රටවල් අනුව කපු වර්ග නම් කෙරේ. ඒ අතරින් ඉතාම උසස් කපු වර්ගය ලෙස සැලකෙනුයේ,
(1) චීන කපු (2) මිසර කපු
(3) අමරිකන් උස් බිම් කපු (4) සී අයිලන්ඩ් කපු

(25) කාර්මික කටයුතු සඳහා අවශ්‍ය රෙදිපිළි නිෂ්පාදනයට යොදා ගත හැකි සුදුසු ම කෙඳි වර්ගය වන්නේ,
(1) ඛනිජ කෙඳි (2) ඇස්බැස්ටෝස් කෙඳි
(3) වීදුරු කෙඳි (4) කෘතිම කෙඳි

(26) පිළිස්සුම් පරීක්ෂාවේ දී ගිනි ගනියි. කුඩා අළු ගුලි සෑදෙයි. පිහාටු පිළිස්සෙන ගඳ වහනය වන කෙඳි වර්ගය වන්නේ,
(1) සේද (2) ලෝම
(3) ලිනන් (4) ඛනිජ කෙඳි

(27) දික් නූල් හා හරස් නූල් එකිනෙක බැඳීමේ දී සිදුවන වෙනස්කම් අනුව විවිධ රටා ගොඩනැගේ. ප්‍රධාන සම්මත රටා වනුයේ,
(1) චාම්, දික් දාර, සැටින් (2) චාම්, ජටා, සැටින්
(3) චාම්, හීරි, සැටින් (4) චාම්, ජටා, හීරි

(28) රුවල් නැව් සඳහා යොදා ගන්නා රුවල සෑදීමට යොදා ගත හැකි විශේෂ රෙදි වර්ගය වියාගත හැකි වියමන් රටාව පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) චාම් වියමන (2) ජටා වියමන
(3) දික් දාර වියමන (4) හීරි වියමන

(29) රූපයේ දැක්වෙන වියමන් රටාව වන්නේ,
(1) චාම් වියමන
(2) හරස් දාර වියමන
(3) සැටින් වියමන
(4) දික් දාර වියමන



(30) අභ්‍යන්තර ගෘහ අලංකරණ නිර්මාණ සඳහා වියමන් රටා යොදාගෙන කළ හැකි නිර්මාණ ඇතුළත් පිළිතුරු තෝරන්න.
(1) බිත්ති සැරසිලි, බඳුන් පලස්, කරල් පැදුරු, මල්වාස්
(2) වට්ටි, පෙට්ටි, පැදුරු, පාපිසි
(3) ඇඳ ඇතිරිලි, තුවා, දරණු, මේස රෙදි
(4) බිත්ති සැරසිලි, වට්ටි, පැදුරු, තුවා

(31) මැටි නිර්මාණය සඳහා පාදක වන පාෂාණ වර්ගය වන්නේ,
(1) හිරිගල් ය. (2) ගුරු ගල් ය.
(3) තිරුවානා ගල් ය. (4) ෆෙල්ස්පාර් ය.

(32) මැටි හඳුන්වන උද්භිත විද්‍යාත්මක නාමය වන්නේ,
(1) ඇලිමිනා සිලිකේට් ය. (2) ඇලුමිනා පොස්පේට් ය.
(3) ඇලුමින නයිට්කේට් ය. (4) ඇලුමිනා ඩයොක්සයිඩ් ය.

(33) මැටි නිර්මාණය වූ ස්ථානයේ ම පිහිටි මැටි වර්ගය වන්නේ,
(1) ද්විතියික මැටි ය. (2) ප්‍රාථමික මැටි ය.
(3) බෝල මැටි ය. (4) රතු මැටි ය.

(34) උළු, ගඩොල් පෝරණු උපාංග වළං, හට්ටි මුට්ටි නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන මැටි වර්ගය වන්නේ,
(1) කෙඔලින් මැටි ය. (2) මකුලු මැටි ය.
(3) ද්විතියික මැටි ය. (4) ගිනි මැටි ය.

(35) මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී යොදා ගන්නා මැටිවල භෞතික හා රසායනික ලක්ෂණ අතර ජලය උරා ගැනීමේ හැකියාව හඳුන්වන්නේ,
(1) සුවිකාර්යතාවය (2) සවිවරතාවය
(3) හැකිලීම. (4) වර්ණය

(36) පදම් මැටි වියළීම වළක්වා ගැනීම සඳහා ගබඩා කර තබා ගත හැකි සුදුසුම ක්‍රමය වන්නේ,
(1) ජලය දමා තැබීම. (2) ඉටි කොළයක ඔතා තැබීම.
(3) මැටි පෙට්ටියේ තබා වසා තැබීම. (4) සබන් දියරවල ගිල්වා තැබීම.

(37) පැච් වර්ක් නිර්මාණය සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩති නිර්මාණය තෝරන්න.


(1)


(2)


(3)


(4)

(38) මෙම විසිතුරු මැහුම් ක්‍රමය කුමක් ද?
(1) බ්ලැන්කට් මැස්ම ය.
(2) ලේසි ඩේසි මැස්ම ය.
(3) හුරුළු කටු මැස්ම ය.
(4) දම්වැල් මැස්ම ය.



(39) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා භාවිතා කරන මැහුම් ක්‍රම ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) හුරුළු කටු මැස්ම, රිබන් මැස්ම ය. (2) දම්වැල් මැස්ම, බ්ලැන්කට් මැස්ම ය.
(3) රිබන් මැස්ම, ප්‍රංශ ගාම මැස්ම ය. (4) දම්වැල් මැස්ම, ලේසිඩේසි මැස්ම ය.

(40) රිබන් නිර්මණ සඳහා වැඩි වශයෙන් භාවිත කරන රිබන් වර්ග දෙක වන්නේ,
(1) 1/2cm රිබන් හා බේබි රිබන් ය. (2) ෂේඩඩ්රිබන්, බේබි රිබන් ය.
(3) මිගන්ඩි අරිබන් බෙබි රිබන් ය. (4) ඕගන්දි රිබන්, ෂේඩඩ් රිබන් ය.